# පාණදුරා වාදය හා කශ්‍යාපා ලොපිංග්ස්

පාණදුරා වාදයට අවුරුදු එකසිය තිහක් පිරීම නිමිත්තෙන් පවත්වන ලද උත්සවයේදී කළ කතාවල සඳහන් වූ දේ මම නොදනිමි. ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලදැයි සඳහන් වන ශාස්ත්‍රීය සංග්‍රහයෙහි අඩංගු ලිපි ගැන ද මම නොදනිමි. එහෙත් ඒ සම්බන්ධයෙන් පුවත්පත්වල පළවුණු ලිපි ඉතිහාසයේ සිද්ධියක නැවත වාර්තා කිරීමට වඩා වැඩි දෙයක් නොවීය. මේ වාදය කුමක් අරමුණු කරගෙන කරන ලද්දක්ද? එහි පසුබිම කුමක්ද? පාණදුරා වාදයට සම්බන්ධ පාණදුරේ රංකොත් විහාරය යම් ප්‍රමාණයකට මේ විවාදයේ පසුබිම කියාපාන කැඩපතක් වැනිය. අද සිදුවෙමින් පවතින දේ අවබෝධ කර ගැනීමටද අපට පාණදුරා වාදය උපකාරී වෙයි.

1815 දී අප රට ඉංගිරිසින්ට ගිවිසුමක් මගින් භාර දීමෙන් පසුව සිදුවූ ඇතැම් දේ විටින් විට ඉරිදා දිවයින සංග්‍රහයට ලියා ඇති ඇතැම් ලිපි මගින් සඳහන් කෙරී ඇත. එවකට ලෝකයේ සිටි බලවත්ම ජාතියට යුද්ධයෙන් නොපැරදුණු අපි සටකපට රාජ්‍ය තන්ත්‍ර ඉදිරියේ ඔවුන්ට අවසානයේදී දිනුම අත්කර දුන්නෙමු. ඉංගිරිසින් තරම් සටකපට යටත්විජිතවාදී පිරිසක් ලෝක ඉතිහාසයේ කිසි දිනක සිටින්නට නැත. ඔවුන් මුළු මහත් අධිරාජ්‍යයක්ම පාලනය කෙළේ විශාල යුද්ධ හමුදාවක් මගින් නොව කුඩා සිවිල් සේවයක් මගිනි. එංගලන්තයේ ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය තරම් පරිපාලනයෙහි කුට රාජ්‍ය තන්ත්‍රයෙහි කළමනා කරණයෙහි දක්ෂයන් පිරිසක් බිහිකර ඇති වෙනත් සංස්කෘතියක් නැත. ඇමරිකන් සංස්කෘතියද එහි ප්‍රභේදයක් වුවද ඇමරිකානුවෝ ලෝක පාලනයෙහි ඉංගිරිසින් තරම් දක්ෂයෝ නොවෙති. ඉංගිරිසින්ට මෙන්ම ඇමරිකානුවන්ට ද තාක්ෂණය ඇත. එහෙත් ඇමරිකානුවන්ට ඉංගිරිසින් සතුව තිබූ කුට රාජ්‍ය තාන්ත්‍රික ඥානය නැත. අද ඇමරිකානුවන් ලෝකය පුරාම අනාගන්නේ එබැවිනි. ජර්මානුවන්, ප්‍රංශයන්, නැගෙනහිර යුරෝපීයයන් හා පොදුවේ ගත්කල යුරෝපා මහාද්වීපකයන් අතර වඩා දක්ෂ චින්තකයන් බිහි වී ඇතත් ඔවුනට ඉංගිරිසින්ට තරම් කුට දේශපාලන රාජ්‍ය තාන්ත්‍රික උපාය හා ක්‍රම නැත. ලෝකයේ ඉතා විශාල ප්‍රමාණයක් හිරු නොබසින අධිරාජ්‍යයක් ලෙස පවත්වාගෙන යෑමට එංගලන්තය වැනි කුඩා රටකට හැකි වූයේ ඔවුන්ගේ ආර්ථිකයේ වූ ශක්තියක් නිසාම නොවේ.

ලංකාව යුද්ධයෙන් යටත් කර ගැනීමට නොහැකි යැයි මුල දී කී බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයාටම කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත් ජෝන් ඩොයිලි නම් රාජ්‍ය සේවකයෙකුගේ සටකපට දේශපාලනය හේතුවෙන් අවසානයේ දී සිංහලේ යටත් කර ගැනීමට හැකි විය. උඩරට ගිවිසුම නමින් අද ප්‍රසිද්ධ ගිවිසුම ඩොයිලිගේ නිර්මාණයක් වුවාට සැකයක් නැත. සිංහලේ පාලනය කිරීම සිංහලේ නීතිය අනුව කරන බවටත් බුද්ධාගම හා දේවාලගම රකින බවටත් ගිවිසුමේ සඳහන් කිරීමේ දී ඒ දෙකම ඉටු නොකරන බව ඩොයිලි දැන සිටින්නට ඇත. එහෙත් ඒ වගන්ති දෙක ඇතුළත් නොකර සිංහලේ නායකයන් සමග ගිවිසුමකට එළඹීමට නොහැකි බවද ඔහු දැන සිටියේය. එමෙන්ම ඔහු කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ තවත් දෙයක් ඉගෙන ගන්නට ඇත. එනම් වචනවල එතරම් කල් පවතින අරුත් නැති බවත් තමන්ට කීමට අවශ්‍ය දේ වෙනුවට එහි විරුද්ධය හෝ විරුද්ධයට ආසන්න දෙයක් හෝ කිව හැකි බවත් ගිවිසුම යනු කැඩීමට තිබෙන දේ බවත්ය. ඉංගිරිසියෙන් මා දැක ඇති දක්ෂම පිතිකරුවා ඔහු නොවේ (හී ඉස් නොට් ද බෙස්ට් බැට්ස්මන් අයි හැව් සීන්) යැයි ඉංගිරිසි ජාතිකයකු කියන විට ඉන් අදහස් වන්නේ ඔහු ඉතා අදක්ෂ පිතිකරුවකු ය යන්න වීමට ඇති ඉඩකඩ බොහෝය. එහෙත් එවැනි ප්‍රකාශයකින් කියැවෙන්නේ යමකු දක්ෂම පිතිකරුවා නොවුණද දක්ෂ පිතිකරුවකු යැයි සිංහලයෝ සිතති. අපට පාසලේ උගන්වා ඇති ඉංගිරිසියෙහි ගුඩ්, බෙටර් හා වෙස්ට් යනුවෙන් වචන තුනක් වෙයි. අපට ඉගැන්වෙන්නේ බෙස්ට් නොවේ යන්නෙන් බෙටර් නැත්නම් අඩු තරමින් ගුඩ් වත ගම්‍ය වන බවය. ඒ පංති කාමර ඉංගිරිසියය. එහෙත් ඉංගිරිසි සංස්කෘතිය තුළ සුද්දෝ තමන්ට අවශ්‍ය විට බෙස්ට් නොවේ යන්නෙන් වර්ස්ට් (අදක්ෂම) යන්න ද කියති. එය සංදර්භය තුළ කියැවෙන්නකි. අවුරුදු දෙසීයක් පමණ කාලයක් තිස්සේ ඉංගිරිසින් සමග ගනුදෙනු කළ ද බොහෝ සිංහලයන්ට ඉංගිරිසි සංස්කෘතියේ ඇති සටකපට ගැන එතරම් අවබෝධයක් නැති වීම කණගාටුදායකය. සිංහලයන් දැන ගෙන සිටියේ ඉර හඳ පවත්නා තෙක් ඇති කෙරෙන ගිවිසුම් ගැනය. එහෙත් ඉංගිරිසින් දැන ගෙන සිටියේ පසු දා ඉර පායන තුරු පවතින ගිවිසුම් ගැනය. ඉංගිරිසින්ගේ හිරු නොබසින අධිරාජ්‍යයෙන් හිරු බැස නොගියේ බැරි වෙලාවත් බැස ගියේ නම් ඒ අතරතුර ඉංගිරිසින් හිරුට ද අංචියක් අදිනු ඇතැයි සිතු බැවින් යැයි කතාවක් වෙයි.

© Prof. Nalin De Silva

ඉංගිරිසින් උඩරට ගිවිසුම කැඩුවේ ඔවුන්ගේ වචනවලින්ම කියන්නේ නම් එහි තීන්න වෙලීමටද පෙරය. ඔවුහු ඉන්පසු ක්‍රමයෙන් රාජ්‍යය දළදා වහන්සේ සමග තිබු සම්බන්ධය අත්හළහ. අපේ පළමු ප්‍රධාන නිදහස් සටන් වු 1817-18 මෙන්ම 1848 ද ඉංගිරිසින් විවිධ ආකාරයෙන් ගිවිසුම කැඩීමට විරුද්ධව ඇති විය. ඉංගිරිසිහු විවිධ ක්‍රම හරහා සිංහල බෞද්ධ සංස්කෘතිය වැනසීමට කටයුතු කළහ. අද ද එය කරති. මේ ලිපි පෙළේ අරමුණ එය පැහැදිලි කිරීමය. අප තේරුම් ගත යුතු ප්‍රධාන කරුණක් වෙයි. අවුරුදු පන්සියයක් තිස්සේ අපේ ප්‍රධාන සතුරා වුයේද වන්නේද බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයය. ඉනුදු රෙපරමාදු (ලන්දේසි) හා ඇංග්ලිකන් (ඉංගිරිසි) ක්‍රිස්තියානි යටත්විජිතවාදීහු ඉතා ගොරහැඩිව සිංහලයන් මර්දනය කළ පෘතුගීසීන්ට වඩා සියුම්ම සිංහල බෞද්ධ සංස්කෘතිය වැනසීමේ කටයුත්තේ යෙදුණහ. අද ද යෙදී සිටිති. අද ඔවුන්ට ඇමරිකන් ක්‍රිස්තියානි යටත්විජිතවාදීහුද එක් වී සිටිති. නෝර්වේ ආදී ස්කැන්ඩිනේවියානු රටවල්ද ලුතරවාදී ක්‍රිස්තියානි වෙයි. දෙමළ ජාතිවාදය රෙපරමාදු හා ඇංග්ලිකන් ක්‍රිස්තියානි යටත්විජිතවාද විසින් බිහි කෙරුනක් වෙයි. බෞද්ධයන් අබෞද්ධයන් බවට පත්කරන්නෝ ද ඔවුහුම වෙති. දළදා මාළිගාවට අංචි අදින්නෝ ද ඔවුහුම වෙති.

අද ඔවුහු සීගිරිය ද නැති කිරීමට සැලසුම් කරති. සීගිරිය සංවර්ධනය කිරීමට (නොටි ද බෙස්ට් යන්නෙන් වරස්ට් හඳුන්වන ආකාරයටම නොවුණ ද සංවර්ධනය යන්නෙන් ඔවුන් ඇතැම් විට අදහස් කරන්නේ නැති කිරීමය.) නෝර්වේජියානුවෝ දෙදෙනෙක් පිඹුරුපත් සකසති. ඔවුහු ලුතරවාදී ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් වුවෝ වෙති. එයට ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතියේ මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතාගේ අනුමැතිය ලැබෙයි. ඔහු අද ලංකාවේ පුරා විද්‍යාවේ ප්‍රධාන බලධාරියා වෙයි. සංස්කෘතික ව ඇංග්ලිකන් ක්‍රිස්තියානි වු ලංකාණ්ඩුවේ අනුමැතිය බණ්ඩාරනායක මහතාට ලැබෙයි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදීන් සිංහල සංස්කෘතිය නැති කිරීමට බොහෝ විට යොදා ගන්නේ දෙමළ ජනයා හා ක්‍රිස්තියානි අධ්‍යාපනයෙන් මනස කුරුවලු කරනු ලැබු සිංහලයන්ය. සීගිරිය බටහිරින් එන සුද්දන්ට හා සුද්දියන්ට විකුණා අපේ අනන්‍යතාවය නැති කිරීමේ දී ඔවුහු සංචාරක අමාත්‍යාංශයේ ආචාර්ය රාමනුජන් මහතාගේ සහාය ලබා ගනිති. නෝර්වීජියානුවන් සකස් කරන පිඹුරුපතේ නාට්‍යාකාරයෙන් ලියැවී ඇති කෙටුම් පතකට අනුව සීගිරිය, කශ්‍යාපා (ඒ සුද්දන්ට කාශ්‍යප කියැවෙන අන්දමය. පිරිමි නන්දලා නන්දාලා වන්නේත් සේනක ලා සෙනාකාලා වන්නේත් ඉංගිරිසියෙහි දෙවැනි ස්වරය දීර්ඝ වීමේ රීතිය අනුවය) ලොපිංග්ස් බවට පත්වෙයි. ඊනියා දේශීය ගෘහ නිර්මාණ ශිල්පයක් නමින් ප්‍රභූ ගෘහ නිර්මාණ ශිල්පයක් බිහි කළ බාවාලා ඇෂ්ලි ඩිවොස්ලා ආදීන් සැලසුම් කළ කණ්ඩලම ගැන ස්තෝත්‍ර ගයන්නන් ලවා අවශ්‍ය නම් ඩිවොස්ගේ සීගිරිය ගැන ද කියවා ගත හැකිය. අවශ්‍ය නම් සීගිරි ගී වෙනුවට කශ්‍යාපා ගේය සාහිත්‍යයක් ද බිහි කර ගත හැකිය. ඒ ගේය සාහිත්‍යයෙහි චාලි බෝයිගේ භාරට එකේ සෝන්ග්ස් සක්‍රිබල් කරන (කුරුටුගාන) නිවේදිකාවන් ගැන ද ලියැවෙනු ඇත. කසිකබල් පශ්චාත්නූතනවාදී අනුකාරක ඇංකරයකු කියනු ඇත්තේ දැනටමත් එවැන්නියන් ඇති බවය. මේ ලිපි පෙළේ අරමුණෙහි එවැන්නියන් ද පශ්චාත්නූතනවාදී ඇංකරයන් ද සෙනාකාලා ද ගණනාතලා ද ගංගනාතලා ද බිහි වුයේ කෙසේ දැයි කෙටියෙන් හෝ කීම ද වෙයි. මොවුහු සියල්ලෝ ම අරුත් කිහිපයකින්ම ස්ක්‍රයිබ්ලා (පිටපත්කරන්නෝ, ලේකම්ලා, ලිපිකරුවෝ) පමණක්ම වෙති.

සීගිරිය ගැන විවිධ මත ඇත. කාශ්‍යප රජු එහි ආලකමන්දාවක් ඉදි කළේ යැයි සෙනරත් පරණවිතාන මහතා කීවේය. තවත් අයට සීගිරිය බලකොටුවකි. මෑතකදී හිටපු පුරා විද්‍යා කොමසාරිස්වරයකු වු ආචාර්ය රාජා ද සිල්වා මහතා කියා තිබුණේ සීගිරිය පැරැණි මහායාන විහාරයක් බවය. කෙසේ වෙතත් සීගිරිය පැරැණි විහාරයක් බව පුරා විද්‍යාඥයෝ කියති. කාශ්‍යප රජුට පෙර එහි භිකෂුන් වහන්සේ වැඩ සිටි බවට සාකෂි පුරාවිද්‍යා කැණීම්වලින් හමු වී ඇත. ධාතුසේන රජු දවස මෙරට මහායාන අදහස් තිබු බවට සැකයක් නොමැති නමුත් (අවුකන පිළිම වහන්සේම එයට සාධකයකි.) සීගිරිය ථේරවාදයේ "බලකොටුවක්" වන්නට ඇත. ඇතැම් විට රාජා ද සිල්වා මහතා සඳහන් කරන පරිදි (ඒ මහතා යොදා ගන්නා පශ්චාත් කාශ්‍යප සාධක කෙසේ වෙතත්) සීගිරිය මහාවිහාරක නොවන භිකෂුන් වහන්සේලා වැඩ විසු විහාරයක් වන්නටද ඇත. මේ විහාරය ගැන මහාවංශය සඳහන් නොකරන්නේ ඒ නිසා ද විය හැකිය. මහාවිහාරිය කාශ්‍යප කුමරුට විරුද්ධ වු බව මහාවංශයෙන් පැහැදිලි වෙයි. අනෙක් භිකෂුන් වහන්සේලා කාශ්‍යප කුමරුට පකෂ වු බවක් ඉන් ගම්‍ය නොවේ. කාශ්‍යප කුමරුට වැඩි වශයෙන් ම විරුද්ධ වුයේ, මහාවිහාරික වුවත් නැතත් සීගිරියේ භිකෂුන් වහන්සේද යන ප්‍රශ්නය නැගීමට සිදුවෙයි. කාශ්‍යප රජු කෙළේ මහසෙන් රජු මහාවිහාර භූමියේ උඳු වැපුරූ ආකාරයට පළි ගැනීම සඳහා සීගිරි විහාරය නැති කර එහි උද්‍යානයක් නිර්මාණය කිරීමද? ඒ කෙසේ වෙතත් කාශ්‍යප රජුට ඉතාමත් දකෂ සිංහල ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ හා උද්‍යාන නිර්මාණ

ශිල්පීන්ගේ සේවය ලැබී ඇති බව නම් පැහැදිලිය. ඔවුන් මුහුදු කොල්ලකරුවන් වූ වයිකින්ග්ලා වාසය කළ නෝර්වේ රටින් ආධාර නොගත් බවත් පැහැදිලිය.

සීගිරි විහාරයේ මහාවිහාරික හෝ නොවන සම්බන්ධය කෙසේ වෙතත් කාශ්‍යප රජු විහාරය වෙනුවට උද්‍යානයක් කර එහි පදිංචි වන්නට ඇතැයි සිතිය හැකිය. සිංහල බෞද්ධ සම්ප්‍රදාය දත් සිංහල රජවරු කාශ්‍යප රජුගෙන් පසුව එහි පදිංචිවීමට අදහස් නොකළේ එහි විහාර සම්භවය නිසා වන්නට ඇත. අද මතුකර ගත යුත්තේ මේ ඉතිහාසයයි. එහෙත් ඒ වෙනුවට කෙරෙන්නේ එහි විහාර සම්භවය මුළුමනින්ම අමතක කර කාශ්‍යප රජු පමණක් නොව මිගාර සෙනෙවි ද අභිබවා යන බටහිර රෙපරමාදු ක්‍රිස්තියානි සංස්කෘතියේ ඒජන්තයන් හා බැළයන් පිරිසක් ඉතිහාසය මුළුමනින්ම මකා දැමීමට කටයුතු කිරීමය. මිගාරගේ මෙහෙයවීමෙන් කාශ්‍යප රජුට ඇතැම් විට අවශ්‍ය වන්නට ඇත්තේ සීගිරි විහාරික භිකෂුන් වහන්සේලාගෙන් පමණක් පළිගැනීම විය හැකිය. එහෙත් නූතන මිගෙල්ලාට (මයිකල්ලාට, මිෂෙල්ලාට) අවශ්‍ය වී ඇත්තේ මුළු මහත් සිංහල බෞද්ධ සංස්කෘතියෙන් ම පිළිගැනීමය.

අපි දැන් නැවතත් මෑත ඉතිහාසයට එමු. එහි දී අපේ කතාව ඉංගිරිසි යුගයට පමණක් සීමා කරමු. ක්‍රිස්තියානි ආගමට ගැනීම යනු ආගම වෙනස් කිරීමක් පමණක් නොව සංස්කෘතියද වෙනස් කිරීමක් විය. ක්‍රිස්තියානි ආගමට තාන්න මාන වරප්‍රසාද ආදිය දී හරවා ගත්පිරිසට පමණක් නොව අන් අය සඳහා ද ඉංගිරිසිහු පාසල් පිහිටවූහ. ඔවුන්ගේ උපක්‍රමය වූයේ බෞද්ධයන් ක්‍රිස්තියානීන් කළ නොහැකි නම් නරක අබෞද්ධයන් බවට පත් කිරීමය. ඉන්දියාව සම්බන්ධයෙන් මැකෝලි කළ ප්‍රකාශය ලංකාවට ද අදාළ විය. හමින් දුඹුරු එහෙත් සිතුම් පැතුම්වලින් සුද්දන් වූ පිරිසක් බිහි කිරීම ඉංගිරිසින්ගේ අරමුණ විය. අද අනුකාරක පශ්චාත්නූතනවාදීන්ගේ අරමුණ වී ඇත්තේ ද බටහිර යම් පිරිසක් මෙන් සිතන්නන් මෙරට බිහි කිරීමය. මොවුහු මැකෝලිගේ අවජාතක දරුවෝ වෙති. මෙරට මුලදී ඉංගිරිසි පාසල්වලින් ද පසුව සිංහල පාසල්වලින්ද සිදු වූයේද මැකෝලිගේ අවජාතක දරුවන් බිහි කිරීමය. (අනගාරික ධර්මපාල තුමා වැනි කිහිප දෙනෙකුට ඉන් ගැලවීමට හැකි වීමෙන් මේ කියමන අවලංගු නොවෙයි.) ඉංගිරිසිහු බෞද්ධ සංස්කෘතිය පසෙකට ලා ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍ය මෙරට පිහිටුවෝය. බෞද්ධයන් ඉංගිරිසි ආර්ථිකය තුළට ගැනීමට ඉංගිරිසිහු කටයුතු කළහ. අරක්කු රේන්දය, මිනිරන් පතල් ආදිය හරහා නව ධනපතියන් බිහි කිරීමටත් අනුකාරකයන් බිහි කිරීමටත් ඉංගිරිසින්ට හැකි විය.

ඉංගිරිසි ආර්ථිකය තුළට ගැණුනු මේ බෞද්ධයෝ ඉංගිරිසි පාසල්වල එනම් ක්‍රිස්තියානි පාසල්වල ඉගෙන ක්‍රිස්තියානි සංස්කෘතිය අනුකරණය කළහ. ඔවුන්ට ලැබුණේ ක්‍රිස්තියානි අධ්‍යාපනයකි. ක්‍රිස්තියානි අධ්‍යාපනයක් යනු ක්‍රිස්තියානි ආගම ඉගැන්වීමක් පමණක් නොවේ. ක්‍රිස්තියානි සංස්කෘතිය තුළ නිර්මාණය වූ දැනුමක් ඔවුන්ට දෙනු ලැබිණි. එපමණක් නොව ඒ දැනුම එකම ශාස්ත්‍රීය දැනුම ලෙසද ඉගැන්විණි. එදා සිට අද දක්වාම පාසල්වලත් පසුව විශ්වවිද්‍යාලවලත් කෙරුනේ මේ ක්‍රිස්තියානි සංස්කෘතියක් තුළ බිහි වූ දැනුම එකම ශාස්ත්‍රීය (හා පසුව විද්‍යාත්මක) දැනුම ලෙස බෙදා දීමය. මේ දැනුමෙන් වඩාත් ම කුරුවළු වී ඇත්තේ සමාජයීය විද්‍යා ඉගෙන ගන්නා හා විශ්ෂයෙන්ම උගන්වන පිරිසක් වීම එක්තරා ආකාරයකින් ගත් කල කියා පාන්නේ ඔවුන්ගේ හීන මානයය. අපේ ප්‍රවාද හා සංකල්ප නිර්මාණය කිරීමට වඩා පහසු මේ කෙෂත්‍රවල නමුත් අපේ දැනුම යන සංකල්පයවත් තේරුම් ගැනීමට නොහැකි වී සිටින ප්‍රධාන පිරිස ඇත්තේ මොවුන් අතරය. විශේෂයෙන්ම කොළඹ හා පේරාදෙණි විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන් අතර මොවුන් දැක ගත හැකිය. ඔවුන් සිතන්නේ ඔවුන්ගේ විෂයෙහි බටහිර නිර්මාණය වී ඇති සංකල්ප තේරුම් ගැනීමට අමාරු සංකල්ප බවය. ඔවුන් යොදා ගන්නා සංකල්ප ප්‍රතිකෙෂ්ප කරන අයගේ සංවාද ඔවුන්ට අනුව බුද්ධි මට්ටමෙන් අඩු සංවාදය. උපන් ගෙයි අනුකාරකයන් වූ කොළඹ විශ්වවිද්‍යාලයේ ජයදේව උයන්ගොඩ හා සසංක පෙරේරා වැනි අය එවැනි අදහස් පළ කරති. එහෙත් මට තේරෙන අයුරින් මේ සංකල්ප බැරෑරුම් ඒවා නොවේ. ඒ ඇතැම් සංකල්ප බැරෑරුම් නොවනවා පමණක් නොවේ. එක් රටක ජාතීන් දෙකක් වැනි ඇතැම් සංකල්ප බොල්ය. අනෙක් අතට බටහිර සමාජීය විද්‍යා සංකල්ප නිර්මාණය කෙරී ඇත්තේම බටහිර සංස්කෘතික ආධිපත්‍යය දිගින් දිගටම පවත්වාගෙන යෑමටය. කලකට පෙර ගණනාත ඔබේසේකර ලංකාවට හඳුන්වා දුන් (මොවුහු නිර්මාණයෙහි නොව හඳුන්වා දීමෙහි ශූරයෝ වෙති. මොවුහු "සේල්ස් රෙප්ලා" පමණක්ම වෙති) මහා සම්ප්‍රදාය නම් සංකල්ප එවැන්නකි. සංකල්ප හා ප්‍රවාද (මොවුන්ගේ ප්‍රවාද නමින් සඟරාවක් වෙයි. එහි නැත්තේ ද ප්‍රවාදය) ගැන අනම් මනම් නොකියා ඔවුන් පළමුව කළ යුත්තේ බටහිර ක්‍රිස්තියානි දැනුම එකම ශාස්ත්‍රීය දැනුම බව පෙන්වීමය.

© Prof. Nalin De Silva

දහනමවැනි සියවසේ ඉංගිරිසි අධ්‍යාපනයක් ලැබූ බෞද්ධයෝ බොහෝ ක්‍රිස්තියානි සංස්කෘතිකාංග ලබා ගත්හ. ඉංගිරිසිහු ගිහි බෞද්ධයන් අතරට පමණක් නොව භික්ෂූන් වහන්සේලා අතරටද ඉංගිරිසි ක්‍රිස්තියානි සංකල්ප ගෙන ගියහ. මේ රට තමන්ට අවශ්‍ය ආකාරයට නැටවීමට නම් බෞද්ධ ගිහියන්ගේ ද භික්ෂූන් වහන්සේලාගේ ද කොන්ද කැඩිය යුතු බව ඉංගිරිසිහු තේරුම් ගත්හ. විහාරාධිපති ධුර නායක පදවි ආදිය භික්ෂූන් වහන්සේට පිරි නැමිණි. අධිකරණ නායක පදවිවලින් පිදුම් ලද භික්ෂූන් වහන්සේ ද ගිහි විනිසුරුවකුගෙන් රෝම ලන්දේසී නීතියේ සාධාරණ තීන්දු ලබා ගැනීම සඳහා උසාවියට වැඩම කළහ. ඉංගිරිසින් අතර තිබූ ඉඩකඩම් වැඩිමහල් පුතාට අයිති වීමේ ප්‍රයිමෝජෙනිචර් නීතිය අනුව යමින් විහාරාධිපති තනතුරු ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේට අයිතිවන ආකාරයෙන් නීති සම්පාදනය කළහ. යමකු ක්‍රිස්තියානි සංකල්පවලට භූරු වීමේ භයානක කම නම් එමගින් තමන් නොදැනුවත්වම බටහිර සංස්කෘතික ආධිපත්‍යයට යටවීමට ඉඩක් තිබීමය.

එහෙත් ඉහත සඳහන් ක්‍රියාවලින් පමණක් සිංහල බෞද්ධයන්ගේ කොන්ද කඩා දැමීමට ඉංගිරිසි ඇංග්ලිකන් යටත්විජිතවාදීන්ට නොහැකි විය. පාණදුරා වාදයේ පසු බිම සකස් කෙරුණේ එලෙසය. ඉංගිරිසි ආර්ථිකය තුළ ධණවත් වූවෝ පිරිසක් පාණදුරේ සිටියහ. ඔවුන්ට ක්‍රිස්තියානි සංස්කෘතිකාංග නොතිබුණා නොවේ. මා සිතන ආකාරයට අද පවා රංකොත් විහාරයේ ධර්ම ශාලාවේ බංකු තනා ඇත්තේ පල්ලිවල බංකු අනුකරණය කිරීමෙනි. එහෙත් පාණදුරේ මෙන්ම රටේ බොහෝ තැන්වල සිංහල බෞද්ධයන්ට අභිමානයක්ද තිබුණි. ඇතැම් ක්‍රිස්තියානි සංස්කෘතිකාංග අනුගමනය කිරීමට සිදු වුවද ඔවුහු අද ඇතැම් විශ්වවිද්‍යාලයීය කථිකාචාර්යවරුන් මෙන් ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයට යට නොවූහ. දාවිත් සිල්වා නම් අයකු බුද්ධාගමට අපහාස කිරීම පාණදුරා වාදයෙහි ආසන්න හේතුව ලෙස කියැවෙයි. එහෙත් එය ඊට වඩා ගැඹුරු හා පළල් එකක් විය. එය ඉංගිරිසි ක්‍රිස්තියානි යටත්විජිතවාදයට එරෙහි ව කරන ලද්දක් විය.

**මතු සම්බන්ධයි**

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva